# අයවැය කාරක සභා අවස්ථා විවාදය - 2025

## வரவு செலவுத் திட்டம் தொடர்பான குழுச்சபை விவாதம்- 2025

# Committee Stage Debate on the Budget - 2025

## ප්‍රගති වාර්තාව

## முன்னேற்ற அறிக்கை

## Progress Report

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය

நிர்வாகத்திற்கான பாராளுமன்ற ஆணையாளர் அலுவலகம்

(ஓம்புட்ஸ்மன்)

Office of Parliamentary Commissioner for Administration (Ombudsman)

# ප්‍රගති වාර්තා

## හැඳින්වීම

රාජ්‍ය දෙපාර්තමේන්තු, සංස්ථා, පළාත් පාලන ආයතන හෝ වෙනත් එවැනි ආයතනයක නිලධාරියෙකු විසින් කරන ලද මූලික අයිතිවාසිකම් කඩකිරීමක් හෝ වෙනත් අසාධාරණයක් පිළිබඳව පරීක්ෂා කර සාධාරණය පිළිබඳ නිශ්චය කර සහනදායි නිර්දේශ ඉදිරිපත් කිරීම සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු මගින් ගරු කථානායකවරයා හරහා මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කරන පැමිණිලි, පෙත්සම් කාරක සභාව විසින් කොමසාරිස්වරයා වෙත යොමු කරනු ලබන පෙත්සම් විභාග කර නිර්දේශ ඉදිරිපත් කිරීම අපගේ ප්‍රධාන කාර්යය වේ. මේ සඳහා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන වගන්තිය සමඟ කියවියයුතු 1994 අංක 26 දරන පනතින් සංශෝධිත 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් වරයා පිළිබඳ පනතේ විධිවිධාන මඟින් බලතල ලබාදී ඇත.

## ප්‍රගතිය

2024.01.01 දින සිට 2024.12.31 දක්වා ලැබී ඇති මුළු පැමිණිලි පිළිබඳ විස්තර

ඉහත කාල පරිච්ඡේදය තුල ලැබී ඇති මුළු පැමිණිලි සංඛ්‍යාව 1474 කි. (මහජන පෙත්සම් කාරක සභාවෙන් ලැබී ඇති පැමිණිලි 12ක්ද ඇතුළුව) ඒ අතරින් ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල යටතට නොවැටෙන පැමිණිලි 536ක් වේ. පරීක්ෂණ පවත්වා විමර්ශනය කර සහන ලැබී ඇති පමිණිලි සංඛ්‍යාව 165ක් වන අතර, අනෙකුත් පැමිණිලි සඳහා ඉදිරි පියවර ගෙන කටයුතු කරගෙන යනු ලබයි. ඒ සම්බන්ධයෙන් විශ්ලේෂණය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 2023 වර්ෂය අවසානයේ ඉතිරිව පැවති, පැමිණිලි සංඛ්‍යාව | | 915 |
| **2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව :-** | | |
| (I) සෘජුව ලැබුණු පැමිණිලි | 1462 | |
| (II) මහජන පෙත්සම් කාරක සභාව මගින් යොමු කරන ලද පැමිණිලි | 12 | |
| **(2)** 2024.12.31 දිනට ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව | | 1474 |
| **2024 වර්ෂය තුල කටයුතු සිදු කිරීමට නියමිත මුළු පැමිණිලි වල එකතුව :-** | | **2389** |
| **ලද පැමිණිලි විමර්ශනය කරන ලද ආකාරය** | | |
| ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල යටතට නොවැටෙන පැමිණිලි | 790 | |
| පරීක්ෂණ පවත්වන ලද පැමිණිලි සංඛ්‍යාව | 549 | |
| ඉල්ලීම සාර්ථකව ඉටු වී ඇති පැමිණිලි සංඛ්‍යාව | 165 | |
| ඉදිරි කටයුතු සිදුකරගෙන යනු ලබන පැමිණිලි සංඛ්‍යාව | | **885** |

ප්‍රගතිය සම්බන්ධයෙන් සඳහන් කළයුතු විශේෂිත වූ කරුණු

ඉහතින් සඳහන් වන ප්‍රගතිය ලබා ගැනීම සඳහා මෙම කාර්යාලය විසින් ගෙන ඇති කාර්යයන් ප්‍රමාදයකින් තොරව හා වැඩි කාර්යක්ෂමතාවයකින් සිදුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමට අදහස් කරමි.

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ඉඩම්වල පසු අයිතිය ලබා දිමේදී හා ඔප්පු ලබා දිමේදී සිදුවන ගැටළු සම්බන්ධයෙන් අප ආයතනයට පැමිණිලි රාශියක් වාර්ෂිකව ඉදිරිපත් වේ. එහිදි සැළකිය යුතු කරුණ වන්නේ මහවැලි අධිකාරියේ මුලස්ථාන කාර්යාල ප්‍රධානින්ගෙන් වාර්තා කැඳවූවත් අදාල ඉඩම් පිහිටි මහවැලි කලාප භාර නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන්, කොට්ඨාශ කළමනාකරුවන් හා ඉඩම් නිලධාරින් විසින් තම රාජකාරි පක්ෂග්‍රාහිව සිදුකිරීම හා කාර්යපටිපාටියෙන් බැහැරව කටයුතු කිරීම් සිදුවන බවයි. අප විසින් වාර්තා කැඳවීමත්, නිලධාරින් ආයතන වෙත කැඳවා පරීක්ෂණ පැවැත්වීමත් අදාළ ගැටලු කඩිනමින් විසඳා ගැනීමට හැකි වූ අවස්ථා දක්නට ලැබෙන කරුණකි.

- රාජ්‍ය නිලධාරින් සඳහා වූ වෛද්‍ය රක්ෂණ (අග්‍රහාර) ක්‍රමය යටතේ වාරික මුදල් රජයේ නිලධාරින්ගේ වැටුපෙන් අයකර රක්ෂණ භාර අරමුදල වෙත යොමුකරන්නේ එමගින් ලැබෙන ප්‍රතිලාභ ලබාගැනීමේ අපේක්ෂාවෙනි. මේවනවිට සාමාන්‍ය, රිදී හා රන් ලෙස ආකාර තුනකින් රු. 125/= , රු. 300/= හා රු 600/= ලෙස වාරික අයකරනු ලබයි. නමුත් අයදුම්කරුවන් ලෙස ඒ ඒ ක්‍රමය යටතේ වෛද්‍ය රක්ෂණයට අදාල ප්‍රතිලාභ ඉල්ලුම් කර වසරක් හෝ ඊට වැඩිකාලයක් එම මුදල් නොලැබීම හේතුවෙන් අපවෙත පැමිණිලි ලැබෙමින් පවති. ඒ පිළිබඳව විමසීමෙන් පසු අදාල ප්‍රතිලාභ ඉල්ලුම්කරුවන් වෙත ගෙවා තිබුණි. මෙය ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් තම සේවාලාභින්වෙත සේවය සැපයීමේදී අධික ප්‍රමාදයකින් කටයුතු කරමින් පවති. රාජ්‍ය නිලධාරින්ට තමන්වෙත වන දුෂ්කරතා මඟහරවා ගැනීමට මෙවැනි ආයතන වඩා කාර්යක්ෂම කිරීම වැදගත් බව නිරීක්ෂණය කරමි.

- මෙම කාර්යාලයේ කාර්යය භාරය ක්‍රියාත්මක කරන සෑම අවස්ථාවකදීම පවතින නිතී රිති, රෙගුලාසි සහ චක්‍රලේඛ අනුව කටයුතු කරමින් නිර්දේශ නිකුත් කර ඇත. ඒ හේතුවෙන් පරිපාලන තන්ත්‍රය නිවැරදි ආකාරයට ක්‍රියාත්මක කිරීමට උපරිම සහයෝගයක් ලබාදී ඇත.

කාර්යාලයේ ප්‍රගතිය සම්බන්ධයෙන් වන බාධාවන්

- මෙම කාර්යාලයට අනුමත සේවක සංඛ්‍යාව 32 ක් වන අතර, 2024.12.31 දින වන විට අනුයුක්තව සිටින්නේ නිලධාරීන් 17 දෙනෙකු පමණි .මේ අතරින් කළමනාකරණ සේවා නිලධාරි සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව 08ක් වේ. එම පුරප්පාඩු සම්පූර්ණ කරදෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර ඇත. භාෂා පරිවර්තක සේවයේ අනුමත සේවක

සංඛ්‍යාව 2ක් වන අතර, ඒ අතරින් භාෂා පරිවර්තක ඉංග්‍රීසි/දෙමළ තනතුර පුරප්පාඩු වී ඇති අතර, අනුමත රියදුරු සංඛ්‍යාව 2ක් වන අතර, එයින් 01ක් පුරප්පාඩුව පවතී.

- නිලධාරින්ගේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම හා ප්‍රියමනාප සේවා ස්ථානයක් බවට පත්කිරීම සඳහා මූලික වැටුපෙන් 1/3 ක දීමනාව ලබාගැනීමට ඉල්ලීම් කර ඇති අතර, එම ඉල්ලීම අනුමත කර ඇතත්, මෙතෙක් ගෙවීම් කර නැත.

- ආයතන වලින් වාර්තා කැඳවීමේදි අතුරු ලිපි අප වෙත යොමු කරමින් වාර්තාව ලබාදීම ප්‍රමාද වන අතර, ඔවුන් විසින් තම ආයතනයේ පහල ස්ථරවලින් වාර්තා කැඳවමින් සිහිකැඳවීම් යොමු කරමින් කාලය ගතකරමින් සිටි. එලෙස තම පහළ නිලධාරින් විසින් නිසිකලට පිළිතුරු ලබානොදෙන්නේ නම් ඔවුන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමක් සිදුනොවන බැවින් අපහට සිදුවන්නේ එම පහළ නිලධාරින්ගෙන් ද වාර්තා කැඳවීමටයි. එබැවින් අදාළ වාර්තා ලබාදීමේදී ආයතනයේ ඉහල නිලධාරින් විසින් නිසි ක්‍රියාමාර්ග ගන්නේ නම් ප්‍රමාදයකින් තොරව පැමිණිලිකරුවන්ගේ ගැටළු විසඳීමට හැකියාව ලැබේ. තවද, වාර්තා කැඳවීමට හා පරීක්ෂණ පැවැත්වීමට වැයවන මුදල් ඉතිරි කර ගැනීමටද හැකියාව ලැබේ.